**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**
**මහ සභා රැස්වීම.**
**2022.10.18**

**සහභාගි වූ සභික නාමාවලිය :-**

01. ගරු සභාපති.ඩබ්.සුරන්ත ජයලත් වීරසිංහ මහතා
02. ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුනිල් ශාන්ත මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. සුජිත් ප්‍රේමලාල් මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.බී.සමීර රුක්ෂාන් මහතා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් වික්‍රමසූරිය මහතා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. දසුන් මධුරංග වාසනා වික්‍රමගේ මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එස්.එම්. අෂානි ප්‍රියංගිකා මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රණී ඩී.එච්.සීතා පද්මණී මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. සමන්ත රත්නායක මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. අමිත් රණතුංග මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් චන්ද්‍රරත්න කුරුකුල මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ජී. අනෝමා රෝෂිණී නිලන්ති මෙනවිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එම්. ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මල්ක මදුභාෂන මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එන්. ඒ. සාගරිකා පුෂ්ප කුමාරි මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. සුසන්ත කුමාරසිරි මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. චන්ද්‍රසිරි මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී. පැතුම් මධුසංක මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. ජී. බ්‍රෙසිල් නුවන් කුමාර මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.නන්දසේන මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා

**සහභාගි නොවූ සභික නාමාවලිය :-**

නැත.

**සහභාගි වූ නිලධාරීන් :-**

01.ලේකම් (වැ.බ) - එච්.එල්.ප්‍රේමදාස මයා.

02.සංවර්ධන නිලධාරී - ඩී.කේ.නිසංසලා මිය.

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022.10.18 දින පැවති මහ සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 ඔක්තෝම්බර් මස මහ සභා රැස්වීම ආරම්භ කිරීම සඳහා 2022.10.18 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා අසුන් ගන්නා ලදි. ආගමික වතාවත් සිදු කිරීමෙන් හා ජාතික ගීය ගායනා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමේ කථාව පවත්වන ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමාත් ගරු සභික මණ්ඩලයත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත් පිළිගැනීමෙන් අනතුරුව න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

## 01.පසුගිය මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

❖ 2022.09.16 වන දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**

ගරු මන්ත්‍රීතුමනි, 2022.09.16 වෙනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා**

මෙම සභා වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

➢ **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස 16 වැනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## 02.ගරු සභාපතිතුමාගේ නිවේදන.

**නැත.**

## 03. සංදේශ/පෙත්සම්/පැමිණිලි ඉදිරිපත් කිරීම.

**නැත.**

## 04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ.

**නැත.**

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා.

**05.01) 2023 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැණවීමට අදාලව සකස් කරන ලද ගැසට් පත්‍රය දෙමළ බසට පරිවර්තනය කිරීමට අදාල ගාස්තු ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**

2023 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැණවීමට අදාලව සකස් කරන ලද ගැසට් පත්‍රය දෙමළ බසට පරිවර්තනය කිරීමට අදාල රු:7977.50ක මුදල එම්.එම්.අෆ්ෆාන් මහතා හට ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2023 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැණවීමට අදාලව සකස් කරන ලද ගැසට් පත්‍රය දෙමළ බසට පරිවර්තනය කිරීමට අදාල රු:7,977.50ක මුදල එම්.එම්.අෆ්ෆාන් මහතා හට ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.02) 2022 සැප්තැම්බර් මස 1,000,000.00 ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

2022 සැප්තැම්බර් මස මෙම සභාවේ ලක්ෂ 10ට වැඩි වියදම් 01ක් සිදු කරල තියෙනවා. එය විස්තර සහිතව පහතින් දක්වනවා. ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

| අනු අංකය | දිනය | වවුචර් අංකය | චෙක්පත් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | මුදල රු: |
|---|---|---|---|---|---|---|
| 01 | 2022.09.23 | 1002 | 12674 සිට 12689 දක්වා | වැටුප් | කාර්ය මණ්ඩල වැටුප් (ස්ථිර) | 3,403,029.72 |

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස රු:3,403,029.72 වූ ලක්ෂ 10ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.03) නාගරික සංවර්ධන අධිකාරියේ DDG/P2/PC/LA අංක දරණ හා 2022.05.26 දිනැති ලිපිය අනුව සැලසුම් කමිටු සඳහා සහභාගී වන කමිටු සාමාජිකයෙකු වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව රු:1500.00 දක්වා වැඩි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත වීරසිංහ මහතා</u>**

නාගරික සංවර්ධන අධිකාරියේ DDG/P2/PC/LA අංක දරණ හා 2022.05.26 දිනැති ලිපිය මගින් ,සැලසුම් කමිටු දීමනාව වැඩි කරදෙන ලෙස පළාත් පාලන ආයතන කිහිපයකින් ඉල්ලීම් ඉදිරිපත් වී ඇති බවත්, ඒ අනුව ප්‍රාදේශීය සභාවක සැලසුම් කමිටු සඳහා සහභාගී වන කමිටු සාමාජිකයෙකු වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව, රු:1500.00 සිට රු:2500.00 දක්වා පරාසයක වැඩි කිරීම සම්බන්ධව තම අධිකාරියේ විරුද්ධත්වයක් නැති බවත් දන්වලා එවලා තියෙනවා.ඒ අනුව මෙම සභාවේ දැනට රු750.00ක්ව පවතින සැලසුම් කට්ටු දීමනාව රු:1500.00 දක්වා වැඩි කරදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් වෙලා තියෙනවා.මේ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>**

ගරු සභාපතිතුමණි,අපි මේ සැලසුම් කමිටු දීමනාව වැඩි කරනවට විරුද්ධ නැහැ.හැබැයි ඔවුන්ගේ සේවාව හරියට ඉටු විය යුතුයි.

- **ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරියේ DDG/P2/PC/LA අංක දරණ හා 2022.05.26 දිනැති ලිපිය අනුව සැලසුම් කමිටු සඳහා සහභාගී වන කමිටු සාමාජිකයෙකු වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව රු:1,500.00 දක්වා වැඩි කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.04) 2023 වර්ෂය සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු සතිපොල හා කඩකාමර බදුදීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

2023 වර්ෂය සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු සතිපොල හා කඩකාමර බදුදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

මෙම සතිපොලවල සිදු කළ නව තක්සේරුවේ වාර්තා ලැබිල තිබුණේ නැති නිසා අපි මේ යෝජනාව මේ සභා වාරයට කල් දැම්මා.මේ වන විට එම නව තක්සේරු වාර්තාව ලැබිල තියෙනවා. ඒ අනුව මෙම සභාව සතු සතිපොල හා කඩකාමර බදුදීම පිළිබඳව විස්තර මෙහෙමයි.

| අනු අං: | විෂය | පවත්වන දිනය | ලංසු කැදවීමේ පෝරම ගාස්තු (ආපසු නොගෙවන) රු:ශත | ටෙන්ඩර් තැන්පත් මුදල (ආපසු ගෙවන) රු:ශත | අවම ලංසුව රු:ශත |
|---|---|---|---|---|---|
| 01 | පල්ලෙබැද්ද සතිපොළ | සදුදා,සිකුරාදා | 2500.00 | 25,000.00 | 1,000,000.00 |
| 02 | පනාමුර සතිපොළ | බ්‍රහස්පතින්දා | 2500.00 | 25,000.00 | 1,600,000.00 |
| 03 | තුංකම සතිපොළ | බ්‍රහස්පතින්දා, සිකුරාදා | 2500.00 | 25,000.00 | 1,300,000.00 |
| 04 | මුල්ඇඩියාවල සතිපොළ | ඉරිදා | 2500.00 | 25,000.00 | 750,000.00 |
| 05 | කොළඹගෙආර සතිපොළ | බ්‍රහස්පතින්දා | 2500.00 | 25,000.00 | 180,000.00 |
| 06 | 42 පදලංගල සතිපොළ | අඟහරුවාදා | 2500.00 | 25,000.00 | 350,000.00 |
| 07 | උඩවලව සතිපොළ | සෙනසුරාදා | 2500.00 | 25,000.00 | 350,000.00 |
| 08 | පල්ලෙබැද්ද කඩ කාමරය | - | 2500.00 | 1000.00 | 80,000.00 |
| 09 | 42 පදලංගල සතිපොල කඩ කාමර අංක 1,2,3,4,5 | - | 2500.00 | 1000.00 | 6000.00 |
| 10 | පල්ලෙබැද්ද සතිපොල ඉදිරිපිට දකුණු පස බිම් කොටස | - | 2500.00 | 1000.00 | 180000.00 |

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු සතිපොල හා පල්ලෙබැද්ද කඩ කාමරය ඉහත සඳහන් අවම ලංසුව යටතේ 2023 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමටත්, 42 පදලංගල සතිපොල අංක 01,02,03,04 , 05 දරණ කඩ කාමර සහ පල්ලෙබැද්ද සතිපොල ඉදිරිපිට දකුණු පස බිම් කොටස දැනට ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන පුද්ගලයන්ටම 2023 වර්ෂය සඳහාද ලබාදීමටත් සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මිය</u>**

ගරු සභාපතිතුමණි,ඊයේ තමයි මම මේක දැක්කේ.තුංකම සතිපොලේ දකුණු පැත්තට වෙන්න තියෙන ශාලාවේ වහලයේ මීට් හත අටක අඩුවක් තියෙනවා.කවුරු හරි ගලවගෙන ගිහිල්ලද දන්නේ නැහැ.ඒ ගැන ටිකක් හොයල බලන්න වෙයි.

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**</u>
හොඳයි ගරු මන්ත්‍රීතුමිය, අපි ඒ ගැන කඩිනමින් හොයල බලන්නම්.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු සතිපොල හා පල්ලෙබැද්ද කඩ කාමරය ඉහත සඳහන් අවම ලංසුව යටතේ 2023 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමටත්, 42 පදලංගල සතිපොල අංක 01,02,03,04 , 05 දරණ කඩ කාමර සහ පල්ලෙබැද්ද සතිපොල ඉදිරිපිට දකුණුපස බිම් කොටස දැනට ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන පුද්ගලයන්ටම 2023 වර්ෂය සඳහාද ලබාදීමටත් සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.05) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ගොඩනැගිලි අයදුම් පත්‍ර ගාස්තුව රු:1000.00දක්වා වැඩි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ දැනට රු:750.00ක්ව පවතින ගොඩනැගිලි අයදුම් පත්‍ර ගාස්තුව රු:1000.00දක්වා වැඩි කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා**</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ දැනට රු:750.00ක්ව පවතින ගොඩනැගිලි අයදුම් පත්‍ර ගාස්තුව රු:1000.00දක්වා වැඩි කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.06) කඩා ඉවත් කර ඇති දේපල, වරිපනම් බදුවලින් නිදහස් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**</u>
උඩවලව ඇඹිලිපිටිය පාර දකුණු අත පැත්ත වරිපනම් අංක 10/2 (උළු සෙවිලි නිවස) හා උඩවලව ඇඹිලිපිටිය වම් අත වරිපනම් අංක 613 (කඩ කාමරය) මේ වන විට අයිතිකරුවන් විසින් කඩා ඉවත් කරලා තියෙන්නේ.නමුත් එම කඩා ඉවත් කර ඇති දේපල සඳහා දිගින් දිගටම වරිපනම් බදු ගෙවීමට සිදු වී ඇති බවත්, එබැවින් එම කඩා ඉවත් කරන ලද දේපල වරිපනම් බදුවලින් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලමින් 97,තිඹොල්කැටිය,කොළඹගෙආර ලිපිනයේ පදිංචි රූබසිංහගේ විමලසිරි හා අජන්තා නිවස,උඩවලව හන්දිය,කොළඹගෙආර, ලිපිනයේ පදිංචි ඒ.ජී.ගුණසේකර යන අය විසින් ලිපි දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා. වරිපනම් අංක 10 (සිල්ලර කඩය),වරිපනම් අංක 10/1 (ඇස්බැස්ටෝස් සෙවිලි නිවස) හා වරිපනම් අංක 10/2 (උළු සෙවිලි නිවස) යනුවෙන් දේපල තුනක් සඳහා තමන් විසින් මෙතෙක් කල් වරිපනම් බදු ගෙවූ බවත්, තමාගේ ඇස්බැස්ටෝස් සෙවිලි නිවසේ ඇති සොල්දරය වෙනම දේපලක් ලෙස සලකා 10/2 ,උළු සෙවිලි නිවස වශයෙන් වරිපනම් අංකයක් නිකුත් කර ඇති බවත්, එය සාධාරණ නොවන බවත්, මේවන විට තමන් රෝගාතුර වයෝවෘද්ධ පුද්ගලයෙකු බවත්, අජන්තා නිවස,උඩවලව හන්දිය,කොළඹගෙආර, ලිපිනයේ පදිංචි ඒ.ජී.ගුණසේකර යන අය විසින් එම ලිපියේ වැඩි දුරටත් සඳහන් කර තිබෙනවා.ඒ අනුව 2022.08.31 දින ලේකම්,ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී, හා විෂය නිලධාරී ඇතුළු නිලධාරී මණ්ඩලයක් විසින් අදාල දේපල පරීක්ෂා කළා. එහිදී දකුණු අත පැත්ත වරිපනම් අංක 10/2 උළු සෙවිලි නිවස යනුවෙන් ලේඛණවල සඳහන් වී ඇති දේපල ඇත්තටම උළු සෙවිලි නිවසක මිනිස් වාසයට ගත නොහැකි ගරා වැටුණු සොල්දරයක් වශයෙන් හඳුනා ගැණුනා.එහිදී එම දේපල නිශ්චිත වශයෙන් කඩා ඉවත් කර ඇති බවටත්, වරිපනම් අංක නිශ්චිත වශයෙන් හඳුනාගෙන ලේඛණවලින් ඉවත් කිරීම සුදුසු බවටත් එම නිලධාරීන් විසින්

නිර්දේශය ලබාදී තිබෙනවා.ඒ අනුව මෙම කඩා ඉවත් කර ඇති උඩවලව ඇඹිලිපිටිය පාර දකුණු අත පැත්ත වරිපනම් අංක 10/2 (උළු සෙවිලි නිවස) හා උඩවලව ඇඹිලිපිටිය වම් අත වරිපනම් අංක 613 (කඩ කාමරය) වරිපනම් බදුවලින් නිදහස් කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

ගරු සභාපතිතුමණි,අපි ඕක නොදැක්කට ඒ අදාල නිලධාරීන් නිරීක්ෂණය කරල තියෙනවනේ.එහෙම අසාධාරණයක් වෙලා තියෙනව නම් ඒ දීල තියෙන නිර්දේශ අනුව ඉවත් කිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.ඒ වගේම ඉවත් කරනවා නම් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කරන්න.

- **ඒ අනුව, මේ වන විට කඩා ඉවත් කර ඇති උඩවලව ඇඹිලිපිටිය පාර දකුණු අත පැත්ත වරිපනම් අංක 10/2 (උළු සෙවිලි නිවස) හා උඩවලව ඇඹිලිපිටිය වම් අත වරිපනම් අංක 613 (කඩ කාමරය) ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව වරිපනම් බදුවලින් නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.07) පල්ලෙබැද්ද සතිපොල සංවර්ධන කටයුතු හේතුවෙන් පල්ලෙබැද්ද කඩකාමරය 2022 ජනවාරි මස සිට ජූලි මස දක්වා වසා තැබීමට සිදු වූ අතර ඊට අදාල මාස 07ක වාරික මුදල් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

පල්ලෙබැද්ද සතිපොල සංවර්ධන කටයුතු හේතුවෙන් පල්ලෙබැද්ද කඩකාමරය 2022 ජනවාරි මස සිට ජූලි මස දක්වා වසා තැබීමට සිදු වූ අතර ඊට අදාල රු:46670. මුදල (6667.14x07) කපා හැරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, පල්ලෙබැද්ද සතිපොල සංවර්ධන කටයුතු හේතුවෙන් පල්ලෙබැද්ද කඩකාමරය 2022 ජනවාරි මස සිට ජූලි මස දක්වා වසා තැබීමට සිදු වූ අතර ඊට අදාල රු:46,670. මුදල (6667.14x07) ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.08) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ විදුලි කාර්මික තනතුරට අදාලව ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ලබාගන්නා රක්ෂණාවරණය අළුත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ විදුලි කාර්මික තනතුරට අදාලව ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ලබාගන්නා රක්ෂණාවරණය 2022 ඔක්තෝම්බර් මස සිට වර්ෂයක කාලසීමාවකට අළුත් කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ විදුලි කාර්මික තනතුරට අදාලව ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ලබාගන්නා රක්ෂණාවරණය 2022 ඔක්තෝම්බර් මස සිට වර්ෂයක කාලසීමාවකට අළුත් කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.09) 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියා පදිංචි කිරීම සඳහාත්,එම ගාස්තු සම්බන්ධව තීරණයක් ලබා ගැනීමට හා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**</u>

2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියා පදිංචි කිරීම සඳහාත්,සැපයුම්කරුවෙක් ලියාපදිංචි කිරීම වෙනුවෙන් රු:1,000.00 මුදලක් අයකිරීම සඳහාත් අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>**ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.**</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියා පදිංචි කිරීම සඳහාත්,සැපයුම්කරුවෙක් ලියාපදිංචි කිරීම වෙනුවෙන් රු:1,000.00 මුදලක් අයකිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.10) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PB 9856 අංක දරණ කැබ් රථය වෙනුවෙන් ටයර් 02ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PB 9856 අංක දරණ කැබ් රථය වෙනුවෙන් 255/70x15 ප්‍රමාණයේ ටයර් 02ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>**ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා**</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PB 9856 අංක දරණ කැබ් රථය වෙනුවෙන් 255/70x15 ප්‍රමාණයේ ටයර් 02ක් මිලදී ගැනීම සඳහා සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.11) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PF 7457 අංක දරණ කැබ් රථය වෙනුවෙන් ටයර් 04ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PF 7457 අංක දරණ කැබ් රථය වෙනුවෙන් 265/70x16 ප්‍රමාණයේ ටයර් 04ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා**</u>

ගරු සභාපතිතුමණි, PB 9856 කැබ් රථය ලේකම්වරයා රාජකාරී කටයුතු සඳහා පාවිච්චි කරනවා.මම දැනගන්න කැමතියි ඔබතුමාට ලබා දී තිබෙන කැබ් රථය මොනවා සඳහාද පාවිච්චි කරන්නේ කියලා.

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**</u>

සභාපතිවරයාගේ නිළ රාජකාරී කටයුතු සඳහා පාවිච්චි කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා**</u>

මම ඔබතුමාට මෙන්න මේ රූපය පෙන්නන්න කැමතියි.මේ තියෙන්නේ රාජකාරී කටයුතු සඳහා පාවිච්චි කරනවා කියපු කැබ් රථය.

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**</u>

මෙහෙමයි ගරු මන්ත්‍රීතුමණි,මට ඒ කැබ් රථය පෞද්ගලික කාරණා සඳහාත් පාවිච්චි කරන්න පුළුවන්.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා**</u>

එතකොට පහරදීම් සඳහා පාවිච්චි කරන්නත් පුළුවන්ද?

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**</u>

නැහැ,පහරදීම් සඳහා කැබ් රථය කොයි වෙලාවකවත් පාවිච්චි කළේ නැහැ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

මේ පහරදීම සිදුවුණ දවසේ මම ඔබතුමාට දුරකථන ඇමතුමක් ගත්තා.ඔබතුමා ඒ වෙලාවේ මට කිව්වා,ඔබතුමා පහරදීමට ගියේ නැහැ කියලා.අවට ආරක්ෂිත කැමරා පරීක්ෂා කරනකොට අපි දැක්කා ඇඹිලිපිටිය නගර සභාවේ සහ ප්‍රා දේශීය සභාවේ සභාපතිවරුන්ගේ කැබ් රථ දෙකම ගිහිල්ලා එනවා.ඔබතුමා මේ පහරදීමේ හිටියද නැද්ද කියලා අපි තොරතුරු ටික ඔක්කොම හොයාගෙන තියෙන්නේ.ඔබතුමාල කිව්වා කිසිම පහරදීමක් වුණේ නැහැ,අපි බොරුවට පැමිණිලි දැම්මේ කියලා.මේ තියෙන්නේ පහරකෑමට ලක්වුණ පුද්ගලයාගේ පින්තූරේ.මේ ෆොටෝ එකේ පහරදීමක් වෙලා නැහැ කියල පේනවද?මේ පුද්ගලයට තුවාල සිදුවෙලා.ඇහැටත් පහරක් වැදිල තියෙන්නේ.ඔබතුමා කිව්වනේ නගර සභාවේ සභාපතිවරයා ගියා, ඔබතුමා ගියේ නැහැ,ඔබතුමා එතනින්ම ගෙදර ගියා කියලා.

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

නැහැ,නැහැ.මම එහෙම කිව්වේ නැහැ.මම කිව්වේ එතුමා කොහේ ගියාද දන්නේ නැහැ,මම ගෙදර ආවා කියලා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

නමුත් ඔබතුමා එතනට ගිහිල්ලා තියෙනවා.අවට ආරක්ෂිත කැමරාවල සටහන් වෙලා තියෙනවා.

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

ඉතින් මට පාරෙ යන්න තහනමක් නැහැනේ.මට පාරෙ යන්න පුළුවන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

ඔබතුමාට පාරෙ යන්න පුළුවන්.අපි මේ වාහනවල හැම රෙපයාර් එකක්ම සභාවේ අනුමත කරලා දෙනවා.ඔබතුමා කිව්වා මේ කැබ් රථය ඔබතුමාට පෞද්ගලික කටයුතු සඳහාත් පාවිච්චි කරන්න පුළුවන් කියලා.මිනිස්සුන්ට ගහන්න යන එක ඔබතුමාගෙ සංස්කෘතිය වෙන්න ඇති.

සභාවේ සෝෂා........................

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

නැහැ,ඒක මගේ සංස්කෘතිය නෙමෙයි.හැබැයි ඔබතුමාලගෙ ආසන සංවිධායකතුමා හරිම අශෝබන විදියට තමයි එදා කතා කරලා තිබුණේ.එතුමා කතා කරලා තිබුණ විදිය ගුරුවරයෙකුට ගැලපෙන්නේ නැහැ.

සභාවේ සෝෂා.........................

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

ඔබතුමාල ඒ රෙකෝඩින් එක හරියට අහල නැහැ.ඒක හරියට අහලා බලන්න.මම මේ නැගිට්ටේ සභාවෙ වාහන තියෙන්නේ මිනිස්සුන්ට පහර දෙන්න යන්න නෙමෙයි කියලා මතක් කරන්න.ඒ මනුස්සයා වයසක ඇවිදගන්න බැරි ලෙඩෙක්. නෝනා එක තැන ඉන්නේ. එහෙම මනුස්සයෙකුට තමයි ගිහින් ගහලා තියෙන්නේ. අනිවාර්යයෙන් ඔබතුමා ඒ මනුස්සයට ගහන්න සම්බන්ධ වුණා.සන්ෂෙඩ් එක යටට ගිහින් ඔබතුමා මොනවද කළේ කියලා ඔබතුමා දන්නවා.ඔබතුමාගෙ හදවතට එකඟව කතා කරන්න.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PF 7457 අංක දරණ කැබ් රථය වෙනුවෙන් 265/70x16 ප්‍රමාණයේ ටයර් 04ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.12) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 6987 අංක දරණ ටිපර් රථය වෙනුවෙන් ටයර් 04ක්, ටියුබ් 04ක් හා කොලර් 04 බැගින් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 6987 අංක දරණ ටිපර් රථය වෙනුවෙන් 900x20 ප්‍රමාණයේ ටයර් 04ක්, ටියුබ් 04ක් හා කොලර් 04 බැගින් (ටයර් කට්ටල 04ක්) මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා**</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 6987 අංක දරණ ටිපර් රථය වෙනුවෙන් 900x20 ප්‍රමාණයේ ටයර් 04ක්, ටියුබ් 04ක් හා කොලර් 04 බැගින් (ටයර් කට්ටල 04ක්) මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.13) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු MG 330 අංක දරණ මෝටර්ග්‍රේඩර් යන්ත්‍රයේ වයරින් පද්ධතිය හා සර්කල් එක ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහාත්,ජැක් සීල් යොදා රෝද සඳහා ඇණ හා නට් සවි කිරීම සඳහාත්, තල 02ක් යෙදීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු MG 330 අංක දරණ මෝටර්ග්‍රේඩර් යන්ත්‍රයේ වයරින් පද්ධතිය හා සර්කල් එක ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහාත්,ජැක් සීල් යොදා රෝද සඳහා ඇණ හා නට් සවි කිරීම සඳහාත්, තල 02ක් යෙදීම සඳහාත් අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා**</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු MG 330 අංක දරණ මෝටර්ග්‍රේඩර් යන්ත්‍රයේ වයරින් පද්ධතිය හා සර්කල් එක ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහාත්,ජැක් සීල් යොදා රෝද සඳහා ඇණ හා නට් සවි කිරීම සඳහාත්, තල 02ක් යෙදීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

- **2022.03.15 දින මහ සභාවේ හදිසි යෝජනා යටතේ සභාගත කරන ලද, පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් විධිමත් පරිදි නැවත න්‍යාය පත්‍රයට ඇතුළත් කර නිවැරදි තීරණයන්ට එළඹිය යුතු බවට උපදෙස් දෙන ලද යෝජනා.**

**05.14) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගබඩා කාමරයක් සහ වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගබඩා කාමරයක් සහ වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:1,849,500.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා**</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගබඩා කාමරයක් සහ වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:1,849,500.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.15) බලපත්‍ර ගාස්තු ලිපි තැපැල් කිරීම වෙනුවෙන් රු:30,000.00ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

බලපත්‍ර ගාස්තු ලිපි තැපැල් කිරීම වෙනුවෙන් රු:30,000.00ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, බලපත්‍ර ගාස්තු ලිපි තැපැල් කිරීම වෙනුවෙන් රු:30,000.00ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරනු ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.16) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු තෙරුන්නාන්සේගම ජල ව්‍යාපෘතියට පිවිසෙන මාර්ගය පස් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්, ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

මෙම ප්‍රාදේශීය සභාව සතු තෙරුන්නාන්සේගම ජල ව්‍යාපෘතියට පිවිසෙන මාර්ගය පස් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්, ඊට අදාලව සකස් කරන ලද රු:334,700.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු තෙරුන්නාන්සේගම ජල ව්‍යාපෘතියට පිවිසෙන මාර්ගය පස් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්, ඊට අදාලව සකස් කරන ලද රු:334,700.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය විසින් සභා ගත කරන ලද යෝජනාව.</u>**

**05.17) ජූලංගැටේ ග්‍රාමසේවා වසමේ පිහිටි ජූලංගැටේ පොදු සුසාන භූමියේ කොටසක සේවා පියසක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය</u>

ජූලංගැටේ ග්‍රාමසේවා වසමේ පිහිටි ජූලංගැටේ පොදු සුසාන භූමියේ කොටසක සේවා පියසක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

**<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ජූලංගැටේ ග්‍රාමසේවා වසමේ පිහිටි ජූලංගැටේ පොදු සුසාන භූමියේ කොටසක සේවා පියසක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.නන්දසේන මහතා විසින් සභා ගත කරන ලද යෝජනා.</u>**

**05.18) මුල්ලගස්යාය කාවන්තිස්සපුර මාර්ගයේ 2Km ක පමණ කොටස, දෙපස කාණු යොදා පිළිසකර කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.නන්දසේන මහතා</u>**

මුල්ලගස්යාය කාවන්තිස්සපුර මාර්ගයේ 2Km ක පමණ කොටස, දෙපස කාණු යොදා පිළිසකර කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

**<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, මුල්ලගස්යාය කාවන්තිස්සපුර මාර්ගයේ 2Km ක පමණ කොටස, දෙපස කාණු යොදා පිළිසකර කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.19) කුඹුගොඩආර සුජාතා පෙර පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය සඳහා දරුවන්ට අවශ්‍ය ත්‍යාගවලින් කොටසක් හෝ ලබාදීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.නන්දසේන මහතා</u>**

ගරු සභාපතිතුමණි,කුඹුගොඩආර සුජාතා පෙර පාසල සභාව සතු පෙර පාසලක්.මෙම පෙර පාසලේ 2022 වසරේ අධ්‍යාපනය ලබා විසිර යන දරුවන්ගේ වාර්ෂික විවිධ ප්‍රසංගය සඳහා දරුවන්ට අවශ්‍ය ත්‍යාගවලින් කොටසක් හෝ ලබාදීමට හැකි නම් ගොඩක් වටිනවා.මේ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ කාන්තිලතා මහත්මිය</u>**

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, කුඹුගොඩආර සුජාතා පෙර පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය සඳහා දරුවන්ට අවශ්‍ය ත්‍යාගවලින් කොටසක් ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට, ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා විසින් සභා ගත කරන ලද යෝජනා.</u>**

**05.20) පල්ලෙබැද්ද කහකැටිය ශ්‍රී වුස්සදේව පෙර පාසලේ ක්‍රීඩා මිදුල හා ආරක්ෂිත වැට ඉදිකිරීම සඳහා අවශ්‍ය අඟල් 1 ½ හෝ අඟල් 2 ප්‍රමාණයේ ගැල්වනයිස් බට 20ක් ලබාදීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>**

මාගේ කොට්ඨාශයට අයත් පල්ලෙබැද්ද කහකැටිය ශ්‍රී වුස්සදේව පෙර පාසල ප්‍රදේශයේ කුඩා දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධනය සඳහා කැපවී කටයුතු කරන ආයතනයක්.එම දරුවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහාත්,ආරක්ෂාව සඳහාත් මේ දිනවල ක්‍රීඩා මිදුල හා ආරක්ෂිත වැට ඉදිකිරීමට කටයුතු යොදමින් පවතිනවා. මේ සඳහා අවශ්‍ය අඟල් 1 ½ හෝ අඟල් 2 ප්‍රමාණයේ ගැල්වනයිස් බට 20ක් ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, පල්ලෙබැද්ද කහකැටිය ශ්‍රී වුස්සදේව පෙර පාසලේ ක්‍රීඩා මිදුල හා ආරක්ෂිත වැට ඉදිකිරීම සඳහා අවශ්‍ය අඟල් 1 ½ හෝ අඟල් 2 ප්‍රමාණයේ ගැල්වනයිස් බට 20ක් ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## 06.හදිසි යෝජනා.

**06.01) ගරු ආණ්ඩුකාරතුමාගේ හා පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් පරිදි ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය GIS තාක්ෂණය ඔස්සේ සිතියම් ගත කිරීම සඳහා අවශ්‍ය Core i7 වර්ගයේ ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

__ගරු සභාපති සුරන්ත ජයලත් මහතා__

පළාත් පාලන ආයතනවල මාර්ග පද්ධතිය GIS තාක්ෂණය ඔස්සේ සිතියම් ගත කර නීත්‍යානුකූල කිරීම සඳහා බල ප්‍රදේශයට අයත් සියළු මාර්ග පද්ධතිය කඩිනමින් සිතියම් ගත කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ හා පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් ලැබී තිබෙනවා. ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය සිතියම් ගත කිරීම සඳහා Core i7 වර්ගයේ ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීමට අවශ්‍යයයි.මේ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා__

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා__

ගරු සභාපතිතුමණි,දැන් ඔය අධි තාක්ෂණික පරිගණකයක්නේ ඉල්ලන්නේ.අපේ පාසල්වල ගත්තොත් මීට අවුරුදු දහයකට විතර කලින් ගත්ත පරිගණක තමයි තියෙන්නේ.හැබැයි ඒවගෙ අපේ තොරතුරු,පාසලේ තොරතුරු ඔක්කොම ගබඩා වෙනවා.ඉතින් පරිගණකවල ධාරිතාව මදි කියන්නේ ඇයි.ඔය එකක් ලක්ෂ පහක් විතර වෙයි.මෙච්චර ගාණක් වියදම් කරලත් ප්‍රයෝජනයක් නැති වුණොත් එහෙම.ඔබතුමාලට මතක ඇති පහුගිය කාලෙ අවුරුදු පහක් ආපස්සට ලංකාවට බෙහෙත් ගෙනාපු ලේඛණ ටික නැති වුණා.හදපු කෙනා අරගෙන ගිහිල්ලා.එයා කිව්වා මුදල් ගෙව්වේ නැති නිසා සොෆ්ට්වෙයා එකේ පාස්වර්ඩ් එක දෙන්න බැහැ කියලා.පස්සේ අධිකරණයට ගිහිල්ලා තමයි තොරතුරු අරගත්තේ.අපි ඒකයි කියන්නේ.ඕක හදන එක වගේම අවශ්‍ය වෙලාවට දත්ත ගන්න බැරි වුණොත් එහෙම.ගබඩා වෙන්නෙ කොහොමද?පාස්වර්ඩ් මොනවද?සියල්ල දැනගෙන තියෙන්න ඕන.ටික දවසක් ගිහිල්ලා කිව්වොත් මේකෙ Backup එකක් නැහැ,මැෂින් එකේ තිබුණා,මොකක් වෙලාද දන්නේ නැහැ කියලා.මෙච්චර ගාණක් වියදම් කරනවා වගේම මේකෙ හරි අධ්‍යයනයක් නැති වුණොත් ඇත්තටම කවද හරි දවසක මේ සල්ලි අපතේ ගියා වෙන්නත් පුළුවන්.පරිපාලනය වගේම අනිවාර්යයෙන් මේ ගැන දන්න දේශපාලන අධිකාරියේ කෙනෙකුත් නිතරම අවධානෙන් ඉන්න වෙයි.

- **ඒ අනුව, ගරු ආණ්ඩුකාරතුමාගේ හා පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් පරිදි ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය GIS තාක්ෂණය ඔස්සේ සිතියම් ගත කිරීම සඳහා අවශ්‍ය Core i7 වර්ගයේ ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## 07.කාරක සභා වාර්තා සලකා බැලීම.

- **2022.09.30 වැනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව.**

__ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.__

2022.09.30 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා__

2022.09.30 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීම සුදුසු බවට මා යෝජනා කරනවා.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා__

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව 2022.09.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## 08.මාසික ආදායම් වියදම් වාර්තා සලකා බැලීම.

I. **2022 සැප්තැම්බර් මස ලැබීම් සාරාංශය.**
II. **2022 සැප්තැම්බර් මස ගෙවීම් සාරාංශය.**
III. **2022.09.30 දිනට අදායම් එකතු කිරීමේ ප්‍රගති වාර්තා.**
IV. **2022 සැප්තැම්බර් මස ලක්ෂ 10ට වැඩි විදයම්.**

**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.**

2022 සැප්තැම්බර් මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 සැප්තැම්බර් මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

## 09.වෙනත් කරුණු

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රසිරි මුණසිංහ මහතා**

ගරු සභාපතිතුමණි,42 සතිපොල නිරන්තරයෙන් අනවසර පදිංචිකරුවන්ගේ ග්‍රහණයට තතුවෙන සතිපොලක්. අපි සභාවේ නිලධාරින් සහ මන්ත්‍රීවරු පොලිසිය සමග මැදිහත්වෙලා තමයි ඒ අනවසර පදිංචිකරුවන් ඉවත් කළේ. නැවතත් පසුගිය දවසක වෙලංගහවෙල ජුලංගැටේ ප්‍රදේශයේ පුද්ගලයෙක් 42 සතිපොලට අයිති භූමියේ පෙට්ටියක් ගෙනත් තියලා දැන් වෙළදාම් කරනවා. මේ නැති බැරි අහිංසක මනුස්සයෙකුත් නෙමෙයි. ජුලංගැටේ හොඳ බිල්ඩිමක් එහෙම තියෙන පුද්ගලයෙක්. මේක දුටුව ගමන්ම මම ලේකම්තුමා දැනුවත් කලා වහාම මේක ඉවත් කරන්න කියලා. ඕක තියෙන්න තියෙන්න තත්ත්වය තවත් බරපතල වෙනවා. ඔය ඉන්න ගමන් ඒ පුද්ගලයට පුළුවන් ඇතුළේ බිමට කොන්ක්‍රීට් දාගන්න.එහෙම තමයි කලින් ඒවත් කළේ. සභාවෙන් හදල බදු දෙනව නම් දුන්නට කමක් නැහැ. ලේකම්තුමාට මම කිව්වා මොකක් හරි ක්‍රියා මාර්ගයක් ගන්න කියලා .නැත්නම් තව අය මේ වැඩේ කරයි. මොකද මේ කාලේ මිනිස්සු ඉන්නේ හරිම පිඩනයකින්, ආර්ථිකය පිරිහිලා. වහාම ඔබතුමා මේකට මැදිහත්වෙලා මේක ඉවත් කරන්න.

**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා**

මෙය ඔබතුමා කිව්ව වහාම ලේකම්තුමා ගිහින් ඒක නිරික්ෂණය කරලා ආවා. මේක අනවසර ඉදි කිරිමක් කියලා තහවුරු වුණ නිසා, අපි ලිඛිතව එතුමාට දැනුම් දුන්නා, දින 07 ක් ඇතුලත වහාම මේ ඉදි කිරීම ඉවත් කරගන්න කියලා. එහෙම කළේ නැති නම් අපි ඉවත් කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා**

ගරු සභාපතිතුමණි,මටත් ඒ වගේ අර්බුදකාරී ගැටළුවක් තියෙනවා, ඔබතුමාට දැනුම් දෙන්න. මම මේ සම්බන්ධව මීට කලින් වතාවකත් ඔබතුමා සහ ලේකම්තුමා දැනුවත් කලා. උඩවලව ඇත් අතුරු සෙවණ ඉදිරිපිට මාර්ගය දෙපස, ජීප් රථ සංගමය ඔවුන්ට හිතවාදී තවත් පිරිසක් එක්ක එකතුවෙලා ස්ථිර නිවාස ඉදි කරගෙන දැන් පදිංචි වෙන්න සූදානම් වෙලා ඉන්නවා. මේ වන විට ඔවුන් එය තවත් ව්‍යාප්ත කරමින් පවතිනවා. මේක සංචාරක කලාපයක්. ඒ නිසා මේ විදියට ඒ ප්‍රදේශයේ අලංකාරය නැතිවෙන විදියට හදන්නන් වාලේ ඉදි කිරීම් කරන්න දෙන්න බැහැ. අපි මේකට හොඳ සැලැස්මක් හදලා, ලොකු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන්න සූදානම් කරල තිබෙන අවස්ථාවක, මෙහෙම වුණොත් අපට මේ බිම් කොටසේ කිසිම ප්‍රයෝජනයක් නැති වෙයි. මේකට කළ යුතු කුමක්ද කියලා යෝජනාවක් මම කලින් අවස්ථාවක සභාවට ඉදිරිපත් කලා. එක්කො අපි මෙහි රථ ගාලක් හදන්න ඕන. නැත්නම් එතන දැනට ඔවුන් ජීවනෝපායක් කරගෙන යන නිසා, අපගේ විධිමත් සැලැස්මකට අනුව ජංගම රථ ඉදි කරල විධිමත් විදියට බදු දෙන්න ඕන.නැත්නම් අපි සැලැස්මක් හදල දෙන්න ඕන, ඔවුන්ගේ වියදමින් ඉදි කරලා වසර කිහිපයකින් බදු ගන්නා විදියට. මොකද මේ පරිසරයේ තිබෙන සුන්දරත්වයට හානි නො විය යුතුයි, ඉදි කිරීම්වලින්. මොකද මේ

පුරවරය සංචාරක කලාපයක් නිසා. අනිත් එක ජීප්රථ සංගමයට නම් කිසිසේත්ම මේ සඳහා මැදිහත් වීමට ඉඩ දෙන්න එපා. මොකද ඔවුන් තමයි දැනටත් අත්තනෝමතික අයුරින් මෙම ස්ථානයේ පරිපාලන කටයුතු කරගෙන යන්නේ. ජීප් රථ සංගමයට වෙන් කරල දීපු කොටසෙත් කඩයක් ඉදි කරගන්න දීල තියෙන්නේ. එහෙම කරන්න දෙන්න බැහැ. මම කියන්නේ ඔවුන්ගේ ජීවනෝපාය නැති කරන්න කියලා නෙමෙයි. මෙය විධිමත් විදයට කරන්න ඕන කියලයි. එහෙම බැරි වුණොත් අපි මේකෙ ඉදල වැඩකුත් නැහැ. මේක හැකි ඉක්මණින් කරන්න කියලා ඉල්ලනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා**

ගරු සභාපතිතුමණි, මම මේක මන්ත්‍රීවරුන්ගේ අවධානයට යොමු කරනවා. පසුගිය දින වල සංඛපාල කඳුවැටියේ ගල් බොක්කයාය කඳුවැටිය අශ්‍රිතව ප්‍රශ්ණ ගණනාවක් සිදුවුණා. මේ වෙකොට තුන් දෙනෙක් අත්අඩංගුවට අරගෙන ඇප මත මුදා හැරලා, තව පස් දෙනෙක් අත්අඩංගුවට ගන්න හොයනවා. මේකට හේතුව තමයි, හම්බන්තොට ලංවා සිමෙන්ති සමාගමෙන් මේ කන්ද මුදුනේ අක්කර 256 භූමි ප්‍රමාණයක කැල්සයිට් ගලක් කඩන්න අවසර ඉල්ලනවා.මේ සඳහා විශාල මහජන විරෝධයක් මතුවෙලා තියෙනවා. පසුගිය බ්‍රහස්පතින්දා දින ප්‍රාදේශීය ලේකම්තුමාගේ මූලිකත්වයෙන් මේ සමාගම සහ ගම්වාසීන් සමග සාකච්ඡාවක් තිබුණා.එයාල එයාලගෙ සමාගම සහ මුදලාලි ගැන ලොකු වටිනාකමකින් කතා කළා. හැබැයි කන්දේ වටිනාකම ගැන කතා කළේ නැහැ. ගම්වැසියෝ බහුතරයක් මේ කන්ද කඩනවට විරුද්ධයි.හේතුව අවට ගම්වලට ගලායන ජල මූලාශ්‍ර තියෙන්නේ මේ කන්දේ.පුරා විද්‍යාත්මක අතීතුත් මේ කන්ද ගොඩක් වටිනවා. සමාගම එක එක අවස්ථාවල එක එක කතා කියනවා. එක වෙලාවකට කියනවා අපි අමුද්‍රව්‍ය 85% ක් ගේන්නේ පිටරටින්, මෙහෙන් ගන්නේ 15% යි කියලා. අවුරුද්දකට අක්කර 02 ක විතර තමයි කැල්සයිට් ගන්නේ කියලා.හැබැයි අවුරුදු 50 කට තමයි කන්ද ගන්නේ.එයාල කියන කතා පරස්පරයි.ප්‍රාදේශීය ලේකම්තුමත් මට පේන විදියට කම්පැනිය පැත්තේ තමයි ඉන්නේ. එතුමා පස්සෙ සුරංගනා කතා ගොඩක් කියන්න ගත්තා. නමුත් ප්‍රදේශයේ ජනතාවගේ දැඩි විරෝධයක් ආවා. ඒ අය කියන්නේ තැනිතලා භූමියේ ඔය කියන කැල්සයිට් තියෙනවා නම් ඕන තරම් ගන්න.හැබැයි කන්දට අත තියන්න එපා කියලා. මේ භූමි ප්‍රදේශය ප්‍රාදේශීය සභාවටත් අයිතියි. අනික අපි දන්නෙ නැහැ, ඒ කන්දේ එයාල කැණීම් කරන්නේ ඇත්තටම සිමෙන්ති හදන්න අවශ්‍ය කැල්සයිට් හොයන්නද කියලා. සමහරවිට මේකෙ වටිනාකමක් තියෙන ඛනිජ මතු වුණොත් අපනයනය කරන්නත් පුළුවන්.මිනිස්සු කියනවා ඉතුරු 15% ත් පිටරටින් ගේන්න, කන්ද කපන්න එපා කියලා. මම පතල් හා කැණීම් එකට කතා කළා.ඔවුන් මේකට සම්බන්ධ නැහැ කිව්වා. මගේ අදහස නම් අපි සභාවක් වශයෙන් ජනතාව පැත්තේ ඉන්න ඕන. එයාල එයාලගෙ හොරණ පැත්තේ තියෙන ටයර් කර්මාන්ත ශාලාවක් ගැන ලොකුවට කතා කළා. එයාල කියනවා ලංකාවෙන් 50% කට අපි ටයර් දෙනවා කියලා. අපි දන්නවා රු:4000.00ට විතර තිබුණ ත්‍රීවිල් ටයර් එක දැන් 20,000.00 යි. එහෙනම් එයාලට පුළුවන්නේ අඩු මිලට ටයර් දෙන්න.මේවයින් ඔවුන් උපය ගන්නා මිසක් රට ගැන හිතන්නේ නැහැ.අපෙන් මේකට පරිසර වාර්තාවක් ඉල්ලලා නැහැ. ප්‍රාදේශීය ලේකම්ගෙන් තමයි පරිසර වාර්තා ඉල්ලලා තියෙන්නේ. එතුමා කියනවා මේකට අනුමැතිය නොදුන්නොත් එයාට යන්න වෙනවා කියලා.එතකොට එක්කෙනෙක් නැගිටලා කිව්වා ඉතින් ඔබතුමා යන්න,හැබැයි මේක කරන්න ඉඩ දෙන්න එපා කියලා. කෙහොම වුණත් අවසාන අනුමැතිය දෙන්නේ ප්‍රාදේශීය ලේකම්.මේක එයාට නතර කරන්න පුළුවන්. ඒ මිනිස්සුන්ගේ ඉල්ලීම සාධාරණයි. මේක යෝජිත රක්ෂිතයක්. මේක කඳු පන්තියක් නිසා මේක ආරක්ෂා කරගන්න ඕන, කියන මතයේ තමයි මම ඉන්නේ.

**ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා**

ගරු සභාපතිතුමණි,මම 1991 ඉදලා කතා කරපු ප්‍රශ්ණයක් මම අද මේ සභාවේ කතා කරනවා. මින් පස්සේ මම මේ ගැන කවදාවත් කතා කරන්නේ නැහැ. තව මාස 4 කින් අපේ සභාවේ කාලය අවසන්. මම මේ වේදනාවෙන් කතා කරන්නේ. මන්ත්‍රීවරු ඕන විදියක මේ ගැන හිතුවට මට කමක් නැහැ. මේ වකවානුවේ මේ ඉන්න කණ්ඩායමත් එක්ක තමයි, මට දේශපාලනය එපාමෙලා තියෙන්නේ. මම 1991 ඉදල අවුරුදු 27 ක් එක්සත් ජාතික පක්ෂයේ ඉදන් කෑ ගැහුවා මගේ ගමේ කැරකොප්පුව හදල දෙන්න කියලා. නමුත් මට ඒක කරගන්න බැරි වුණා. ඊට පස්සේ පක්ෂෙ මාරු කරලා මේ කණ්ඩායම එක්ක එකතු වෙලාත් කෑ ගැහුවා, කැරකෝප්පුව

හදල දෙන්න කියලා. නමුත් කරගන්න බැරි වුණා. බොහොම කනගාටු වෙනවා. අපි ප්‍රාදේශීය සභාව නියෝජනය කරල මේ වගේ දෙයක්වත් කරගන්න බැරිනම් මේකෙ අපි හිටපු එකෙනුත් වැඩක් නැහැ. දේශපාලනය කරල වැඩකුත් නැහැ. මට අවශ්‍යතාවය තිබුණා දියපොට වසමේ සුසාන භූමිය ආරක්ෂා කරගන්න. මේක නීත්‍යානුකූල සුසාන භූමියක්. නමුත් මේ වනතුරු නිරවුල් වුණේ නැහැ. මේක සභාවෙන් නොකෙරෙන නිසා මම රාජ්‍ය නිලධාරින් සමග සම්බන්ධවෙලා, මේක සුසාන භූමිය කියලා පෙන්නලා, දැනට යම්කිසි ඉදි කිරීමක් කරලා තියෙනවා.ඒ ඉදි කිරීමට මම ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලුවේ සෙවිලි තහඩු 12 ක් පමණයි. ඒක සභාවේ අනුමත වුණා. ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අවශ්‍ය වුණා. සභාපතිතුමා සතියකට කලින් කිව්වා අවශ්‍ය ලියුම් ටික හදල තියන්න කියලා. නමුත් මේ සභාවේ කාගේ හෝ දුර්වතාවයක් නිසා, කඹ ඇදිල්ලක් නිසා ලියුම මට ලැබුණේ නැහැ. ඊට පස්සේ සඳුදා මම උදේ 8.00 වෙනකොට සභාපතිතුමාලගෙ ගෙදරට ආවා. ඉඳලා,ඉඳලා සවස 2.00 ට විතර ලියුම් ටික ලැබුණා. ආණ්ඩුකාරතුමාට ලබා දුන්නා. එතුමා කැමැත්ත ප්‍රකාශ කලා. තාම සෙවිලි තහඩු ටික ලැබුණේ නැහැ. මේක ලැබුණත් නොලැබුණත් මම මේ මාසෙ අග තැත්නම් ලබන මාසෙ මුල තල්අතු හොයලා හරි මේ ගොඩනැගිල්ල විවෘත කරනවා. සභාපතිතුමාට, දේශපාලන භේදයකින් තොරව සියළුම මන්ත්‍රීවරුන්ට, ආණ්ඩුකාරතුමාට, පළාත් පාලන ඇමතිතුමාට, මේ සඳහා ආරාධනා කරනවා. මම දේශපාලනයෙන් සමුගන්න කලින් ගමේ සුසාන භූමියෙදී හරි මට මේ ටික කියන්න අවශ්‍යයයි. මම ඉදිරියේදී ඔබතුමාලාට සහභාගි වෙන්න කියලා දැනුම් දෙනවා. හැකියාවක් තියෙනවා, නම් ගරු සභාපතිතුමණි, මේ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා, මේ කටයුත්ත කරලා දෙන්න කියලා ඉල්ලනවා.ඒක ලැබුණත් නොලැබුණත් මම මේක කරනවා කියලා, මේ අවස්ථාවේ කියනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සීතා පද්මිණී මිය</u>**

ගරු සභාපතිතුමණි, කොළඹගෙආර කන්ද මුදුන සුසාන භූමියේ අක්කරයකට කිට්ටු වෙන්න ඉඩමක් තිබුණා.දැන් අක්කර කාලක්වත් නැහැ. ඒකෙ විශාල ගොඩනැගිලි ටිකකුත් ඉදි කරලා, දැන් වටේටම අල්ලලා .ඔබතුමා මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. මම දන්න කාලෙ ඉඳලා එතන තමයි සුසානභූමිය තිබුණේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

ගරු සභාපතිතුමණි, සුසාන භූමි සම්බන්ධයෙන් කාලෙකට කලින් ඔබතුමා මට වගකීම පැවරුවා. මම හරියටම ඒ වැඩේ කරගෙන ආවා. අදාළ සුසාන භූමිවල කෙළවරක ඉඳලා, වෙන් කරන්න ඕන වැඩ ටික කලා. සමහර ඒවා මැන්නෙව්වා.මැනීමට අවශ්‍ය නිතීමය තත්ත්වයන් ගෙනවා.විෂය නිලධාරි සමග ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, මහවැලියට ගිහිල්ලා කෙරෙන්න ඕන වැඩ කලා. කටු කුඹුරේ සුසාන භූමිය තියෙන්නේ කන්ද මුදුනක.ග්‍රාම සේවක හා ප්‍රාදේශීය ලේකම් සමග එකතු වෙලා ඒ ඉඩම රක්ෂිතයට දාල පහලින් හඳුන ගත්ත ඉඩමකට සුසාන භූමිය ගේන්න කතා කරගෙන තිබුණා. ඇත්තටම ලොකු වැඩසටහනක් ගියා. ඒ වැඩසටහන දිගටම ගියා නම්, වගකීම් කොටස හරියටම පවරලා ගියා නම්, මේ වෙනකොට ගොඩක් ඒවා නිරවුල් වෙලා. සභාවට සුසානභූමි 47ක් තියෙනවා.නමුත් ලේඛනවල 42 තියෙන්නේ. මෙන්න මේ සුසාන භූමියේ මිහිදන් කළා කියලා මරණ සහතික තුනක සුසාන භූමියක නමක් සඳහන් වෙලා තියෙනවා නම් ඒ සුසාන භූමිය අයිති අදාල පළාත් පාලන ආයතනයට. සභාවකට පනතෙන් බලය පවරලා තියෙනවා,ඕනම තැනක මරණ තුනක් මිහිදන් කරලා තියෙනව නම් ඒ සුසානභූමිය සභාවට පවරගන්න.මරණ සහතික තුනක් හොඳටම ප්‍රමාණවත්. කොට්ඨාශයේ මන්ත්‍රීවරයට දැන් වුණත් මැදිහත් වුණොත් කොට්ඨාශයේ සුසානභූමිය නිරවුල් කරගන්න පුළුවන්.හැබැයි ටිකක් රස්තියාදු වෙන්න වෙනවා.මහන්සි වෙන්න වෙනවා.සුසානභූමි 17ක් විතර මම මැදිහත් වෙලා නිරවුල් කළා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>**

ගරු සභාපතිතුමණි, සංඛ්‍යාපාල කඳුවැටියට ඓතිහාසික කඳුවැටියෙ තියෙන සියළුම දේ අයිතියි. ජල මූලාශ්‍ර ටික ඔක්කොම තියෙන්නේ ඔය කඳුවැටියේ. ඔවුන් කිව්වට නැවත කඳු වැටියක් හදන්නේ කොහොමද? මේක පාරිසරිකව බලපාන්න ලොකු හේතුවක් තියෙනවා. මධ්‍යම කඳුකරය ඇරුණම මේ ප්‍රදේශයට වෙන සියළුම කාලගුණික විපර්යාසවලට බලපාන්නෙ මේ කන්ද. ඒ නිසා මේ කන්ද කැපුවොත් මුළු ප්‍රදේශයම

ව්‍යාකූලතාවයකට ලක් වෙනවා. ඒක වලක්වන්න බැහැ. කන්ද කැපුවොත් නාය යන්නත් පටන් ගන්නවා. ඒ නිසා දැඩි පරිසර හානියක් වෙනවා. මොන නිලධාරියාට යන්න වුණත් මේක කපන්න දෙන්න බැහැ. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.අනිත් එක සුනිල් මන්ත්‍රීතුමා කියපු කාරණාව.ඒකට අපේ කාර්මික නිලධාරීතුමා යවලා එක වගේ ප්ලෑන් එකක් ඇඳලා,ඒ අනුව ඉදි කිරීම් කරලා බදු පදනම මත ඒ ඉන්න අයට ලබා දෙන්න.නැත්නම් හරිම අවලස්සනයි.ඒ නිසා ඒ සම්බන්ධවත් අවධානය යොමු කරන්න.ඒ වගේම උප සභාපතිතුමාගේ සෙවිලි තහඩු ටිකත් ලබාදෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>**

ගරු සභාපතිතුමණි,සංඛපාල කඳුවැටියේ කැල්සයිට් කැනීම් සිදු කරනවට සභාවේ සියළුම මන්ත්‍රීවරුන් තරයේ විරුද්ධයි කියලා අවශ්‍ය සියළුම ආයතනවලට දැනුම් දෙන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මිය</u>**

ගරු සභාපතිතුමණි,මේ දිනවල පවතින දැඩි ආර්ථික දුෂ්කරතා නිසා තියෙන පුංචි ඉඩක හරි මොනව හරි පැලයක් වවන්න තමයි මිනිස්සු බලන්නේ.බොහොම අමාරුවෙන් මිනිස්සු වගා කරපු බෝගවලට අයාලේ යන ගවයන්ගෙන් හරිම කරදරයි.ඒ සතුන් වගාවල්වලට පැණලා වගා හානි සිදු කරනවා.කුට්ටිගල ප්‍රදේශයේ මේ ගැටළුව ලොකුවටම තියෙනවා.අනිත් කොට්ඨාශවලත් ඇති.මීගවයින් සහ එළ ගවයෝ දෙගොල්ලොම අයිතිකරුවන් නිදැල්ලේ අතහැරලා තියෙන්නේ.මේ සම්බන්ධව ඔබතුමා හමුවෙලා කතා කරන්න අද ඒ අය එනවා කියලා කිව්වා.තවම ඇවිත් නැහැ.කොහොම වුණත් මේ පිළිබඳවත් සභාවේ අවධානය යොමු කරලා යම්කිසි විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

සංඛපාල කඳුවැටිය ගැන කතා කරනකොට පරිසර හානියක් සිදු වෙනව නම් අපි කොහොමත් විරුද්ධයි.මේක සාම්ප්‍රදායික විරුද්ධවීමක් නෙමෙයි.මේ පිළිබඳව මන්ත්‍රීවරුන්ගේ අදහස්වලට මම 100%ක් එකඟයි.ඒ නිසා මන්ත්‍රීවරුන් ඕනෑම අවස්ථාවක මට කතා කරන්න.මම මැදිහත් වෙනවා.ඇත් අතුරු සෙවනේ කඩ ඉදිකිරීම් සම්බන්ධව මම නිරීක්ෂණය කළා.කොහොමත් මේ අය සමග සාකච්ඡාවක් ගන්නවා මම.එහිදී අපේ සැලැස්ම මම ඔවුන්ට පෙන්නනවා.මෙන්න මේ විදියට පුළුවන් නම් ඉදි කිරීම් කරන්න කියලා.එහෙම බැරි නම් ඉවත් කරමු.මම සාකච්ඡාව තියෙන දවසට කොට්ඨාශයේ මන්ත්‍රීවරු දැනුවත් කරන්නම්.උප සභාපතිතුමාගේ කාරණාවෙදි මම එතුමා සමග 100%ක් එකපයි.අපේ සමහර නිලධාරීන් මොනව හරි කොල කැල්ලක් එව්වම ඒක පදනම් කරගෙන සියල්ල නතර කරනවා.ඒක සමහර නිලධාරීන්ගේ තියෙන අඩුපාඩුවක්.මේ වෙන කොට සෑම ආයතනයකම සංවර්ධන කටයුතු සීමා කරලා තියෙනවා.ඒ වියදම් සීමා කරලා චක්‍රලේඛයක් නිකුත් කරපු නිසා.සීමා කිරීම සහ තහනම් කිරීම වචන දෙකක්.සීමා කළාම තහනම් කරපු තැන ඉඳලා තමයි අපේ අය වැඩ කරන්නේ.මේ වචන තේරුම් ගත්තේ නැහැ.විධායක ඉංජිනේරු කාර්යාලය ගත්තම මේ වෙන කොට හොඳටම වැඩ කරනවා මේ වෙලාවේ.මේ කියන චක්‍රලේඛය ඒ ආයතනවලටත් ගිහින් තියෙන්නේ.හැබැයි ඒ ආයතන වැඩ.ඒ නිලධාරි වැඩ කරනවා.ඒ සුසාන භූමිය අපේ.රජයේ ආයතනයකින් යම් වියදමක් කළා කියලා ඒ භූමිය අපේ.යම් භූමියක අයිතිය අපට නම් ඒකෙ තියෙන සියළු දේ අයිති අපට.මිනිස්සුන්ට සෙතක් වෙනව නම් ඔය මොන එපාකම් කිව්වත් සභාවට මැදිහත්වෙලා යමක් කරන්න පුළුවන් හැකියාවක් තියෙනවා.එහෙම බැහැ මේක අර අය හදපු එකක් කියලා මොන නිලධාරියා කිව්වත් ඒක වැරදියි.ගොඩනැග්ල්ල හදන්නෙත් අපේ ඉල්ලීමකට.ජනතාවට අපි කරන්නේ සේවාවක්.සමහර නිලධාරීන් කොළ කැල්ලක් දැක්කම බය වෙනවා.අපි මේ යෝජනාව ආණ්ඩුකාරතුමාට යවලා තියෙන්නේ.ඔබතුමාට දෙසැරයක් විතර ගිහින් බලන්න වෙයි.අපේ කාන්තිලතා මන්ත්‍රීතුමිය කතා කරපු ගැටළුව ගැන කතා කරද්දී ගමේ මහ ජනතාව ඔය සම්බන්ධව කිහිප අවස්ථාවකදීම අපි සමග කතා කළා.අපි කිහිප අවස්ථාවකදීම අයාලේ යන ගවයින් අල්ලන්න ගියා.ඒ යන කිසිම අවස්ථාවක ගවයෝ නිදැල්ලේ නැහැ.අයිතිකාරයෝ උන් අරගෙන ගිහිල්ලා ගාල්වලට දාලා.අපි පොලීසියත් සමග තමයි මේ හැම වෙලාවකම ගියේ.කොහොම හරි අයිතිකරුවන්ට පණිවිඩය යනවා.මම දන්නේ නැහැ ඒක කොහොම වෙනවද කියලා.කොහොම වුණත් ඉදිරියේදී අපි ඒ සම්බන්ධව කළ හැකි දේ කරමු.

- **ගරු සභාපති තුමාගේ ස්තූති කථාව.**

අද දින මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහාය ලබා දුන් සියලුම ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් මාගේ ගෞරව පූර්වක ස්තූතිය පුදකර සිටිනවා.

2022.10.18 වන දින පැවති මහ සභාව ප.ව. 1.30ට පමණ නිමාවට පත් විය.

සුරන්ත වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.